54 සූරා අල් කමර්

(චන්ද්‍රයා)

ආයත් 1-55 දක්වා.

අල් කුර්ආනය

< Sinhala>

මාහිර් රම්ඩීන්
පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය

විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة القمر- 54

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ونخبة من العلماء الكرام

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

54 සූරත් අල්-කමර් (චන්ද්‍රයා)

මක්කාහ්වෙහි දී හෙළිදරව් කෙරුණකි.

ආයාත් (වැකි) 55 කි.

بِسْمِ اللهِ الرَّحمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-8 සඳු දෙපළුවීමේ ප්‍රාතිහාර්යය පිළිබඳ දේව ආදේශකයින්ගේ ස්ථාවරය සහ ඔවුනට කෙරුණු අවවාදය.

اقْتَرَبَتِ السَّاعَةُ وَانْشَقَّ الْقَمَرُ {1}

අවසන් හෝරාව සමීප වී ඇත. තවද චන්ද්‍රයා පැළී ගොස් ඇත.

وَإِنْ يَرَوْا آيَةً يُعْرِضُوا وَيَقُولُوا سِحْرٌ مُسْتَمِرٌّ {2}

තවද යම් සංඥාවක් ඔවුන් දුටු විට ඔවුන් පිටුපා (මෙය) ‘පැවත එන හූනියමක්’ යැයි පවසති.

وَكَذَّبُوا وَاتَّبَعُوا أَهْوَاءَهُمْ ۚ وَكُلُّ أَمْرٍ مُسْتَقِرٌّ {3}

තවද ඔවුහු බොරු යැයි පවසා තම ආශාවන් අනුගමනය කරති. තවද (යහපත් හා අයහපත් යන) සෑම කරුණක්ම සිදුවන්නකි.

وَلَقَدْ جَاءَهُمْ مِنَ الْأَنْبَاءِ مَا فِيهِ مُزْدَجَرٌ {4} حِكْمَةٌ بَالِغَةٌ ۖ فَمَا تُغْنِ النُّذُرُ {5}

තවද එහි ගැඹුරු ප්‍රඥාව ඇති වළක්වාලන අවවාදයන් සහිත තොරතුරු ඔවුන් වෙත සැබැවින්ම පැමිණ ඇත. නමුත් එම අවවාදය ඵලක් නොවීය.

فَتَوَلَّ عَنْهُمْ ۘ يَوْمَ يَدْعُ الدَّاعِ إِلَىٰ شَيْءٍ نُكُرٍ {6}

එහෙයින් (නබිවරය) කැඳවන්නා පිළිකුල් කරුණක් වෙත කැඳවන දිනයෙහි නුඹ ඔවුන්ගෙන් ඉවත් වනු.

خُشَّعًا أَبْصَارُهُمْ يَخْرُجُونَ مِنَ الْأَجْدَاثِ كَأَنَّهُمْ جَرَادٌ مُنْتَشِرٌ {7}

ඔවුන්ගේ බැල්ම අවමන් පහත් භාවයෙන් යුතු ව නියත වශයෙන්ම ඔවුන් විසිරී සිටින පළඟැටියන් මෙන් මිනිවළ වල් වෙතින් බැහැර වෙති.

مُهْطِعِينَ إِلَى الدَّاعِ ۖ يَقُولُ الْكَافِرُونَ هَٰذَا يَوْمٌ عَسِرٌ {8}

කැඳවන්නා වෙත බෙලි දිගු කරමින් වේගයෙන් පැමිණෙන්නන් ලෙසින් (ඔවුහු බැහැර වෙති.) “මෙය දුෂ්කර දිනයකි” යැයි ප්‍රතික්ෂේපකයෝ පවසති.

9-17 නූහ් (අලයිහිස් සලාම්) තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ قَبْلَهُمْ قَوْمُ نُوحٍ فَكَذَّبُوا عَبْدَنَا وَقَالُوا مَجْنُونٌ وَازْدُجِرَ {9}

ඔවුනට පෙර සිටි නූහ්ගේ ජනයා ද බොරු කළෝය. එසේම ඔවුහු අපගේ ගැත්තා බොරු කොට උම්මත්තකයෙකු යැයි පැවසූහ. තවද ඔහු පලවා හරිනු ලැබීය.

فَدَعَا رَبَّهُ أَنِّي مَغْلُوبٌ فَانْتَصِرْ {10}

එවිට ඔහු නියත වශයෙන්ම “මා අබිබවා යනු ලැබුවෙමි. එහෙයින් මට උදව් කරනු මැනව!” යැයි ඔහුගේ පරමාධිපතිට ප්‍රාර්ථනා කළේය.

فَفَتَحْنَا أَبْوَابَ السَّمَاءِ بِمَاءٍ مُنْهَمِرٍ {11}

එවිට අපි ධාරානිපාත වැසි ජලයෙන් අහස්හි දොරවල් විවෘත කළෙමු.

وَفَجَّرْنَا الْأَرْضَ عُيُونًا فَالْتَقَى الْمَاءُ عَلَىٰ أَمْرٍ قَدْ قُدِرَ {12}

තවද අපි මහපොළොවෙහි උල්පත් හට ගැන්වූයෙමු. එවිට පෙර නිර්ණය කරන ලද කරුණක් අනුව එම ජලය (වැසි ජලය සමග) එකතු විය.

وَحَمَلْنَاهُ عَلَىٰ ذَاتِ أَلْوَاحٍ وَدُسُرٍ {13}

තවද ලෑලි හා ඇණ සහිත දෑ (නැව) මත අපි ඔහු උසුලුවෙමු.

تَجْرِي بِأَعْيُنِنَا جَزَاءً لِمَنْ كَانَ كُفِرَ {14}

ප්‍රතික්ෂේප කරනු ලැබ සිටි අයට තිළිණයක් වශයෙන් අපගේ ඇස් ඉදිරිපිට එය යාත්‍රා විය.

وَلَقَدْ تَرَكْنَاهَا آيَةً فَهَلْ مِنْ مُدَّكِرٍ {15}

තවද සැබැවින්ම අපි එය සංඥාවක් වශයෙන් ඉතිරි කළෙමු. එහෙයින් උපදෙස් ලබන කිසිවකු හෝ වෙත් ද?

فَكَيْفَ كَانَ عَذَابِي وَنُذُرِ {16}

එවිට මාගේ දඬුවම හා මාගේ අවවාදය කෙසේ වීද?

وَلَقَدْ يَسَّرْنَا الْقُرْآنَ لِلذِّكْرِ فَهَلْ مِنْ مُدَّكِرٍ {17}

තවද අල් කුර්ආනය මෙනෙහි කිරීම සඳහා සැබැවින්ම අපි පහසු කළෙමු. එහෙයින් මෙනෙහි කරන කිසිවකු හෝ වෙත් ද?

18-22 ආද් සමූහයාගේ ඉරණම.

كَذَّبَتْ عَادٌ فَكَيْفَ كَانَ عَذَابِي وَنُذُرِ {18}

ආද් සමූහයා බොරු කළෝය. එහෙයින් මාගේ දඬුවම හා මාගේ අවවාදය කෙසේ වී ද?

إِنَّا أَرْسَلْنَا عَلَيْهِمْ رِيحًا صَرْصَرًا فِي يَوْمِ نَحْسٍ مُسْتَمِرٍّ {19}

අභාග්‍යය රැඳී පවතින දිනක නියත වශයෙන්ම අපි ඔවුන් වෙත සැඩ සුළඟක් එව්වෙමු.

تَنْزِعُ النَّاسَ كَأَنَّهُمْ أَعْجَازُ نَخْلٍ مُنْقَعِرٍ {20}

නියත වශයෙන්ම ඔවුන් මුලිනුදුරන ලද රටඉඳි ගස් කඳන් මෙන් එය ජනයා උගුලා දැමීය.

فَكَيْفَ كَانَ عَذَابِي وَنُذُرِ {21}

එවිට මාගේ දඬුවම හා මාගේ අවවාදය කෙසේ වී ද?

وَلَقَدْ يَسَّرْنَا الْقُرْآنَ لِلذِّكْرِ فَهَلْ مِنْ مُدَّكِرٍ {22}

තවද අල් කුර්ආනය මෙනෙහි කිරීම සඳහා සැබැවින්ම අපි පහසු කළෙමු. එහෙයින් මෙනෙහි කරන කිසිවකු හෝ වෙත් ද?

23-32 සමූද් සමූහයාගේ ඉරණම.

كَذَّبَتْ ثَمُودُ بِالنُّذُرِ {23}

සමූද් ජනයා එම අවවාදය බොරු කළෝය.

فَقَالُوا أَبَشَرًا مِنَّا وَاحِدًا نَتَّبِعُهُ إِنَّا إِذًا لَفِي ضَلَالٍ وَسُعُرٍ {24}

අපගෙන් එක් මිනිසෙකු වූ ඔහු ව ද අපි අනුගමනය කළ යුත්තේ? නියත වශයෙන්ම අපි එවිට නොමගෙහි හා දුෂ්කරත්වය තුළ වන්නෙමු.

أَأُلْقِيَ الذِّكْرُ عَلَيْهِ مِنْ بَيْنِنَا بَلْ هُوَ كَذَّابٌ أَشِرٌ {25}

“අප අතුරින් ඔහු වෙත උපදෙස ඉදිරිපත් කරනු ලැබුවේ ද? එසේ නොව ඔහු ගර්වයෙන් යුත් මහා බොරුකාරයෙකි.”

سَيَعْلَمُونَ غَدًا مَنِ الْكَذَّابُ الْأَشِرُ {26}

ගර්වයෙන් යුත් මහා බොරුකාරයා කවුරුන් දැයි හෙට (මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන) දින ඔවුහු දැන ගනු ඇත.

إِنَّا مُرْسِلُو النَّاقَةِ فِتْنَةً لَهُمْ فَارْتَقِبْهُمْ وَاصْطَبِرْ {27}

නියත වශයෙන්ම අපි ඔටු දෙන ඔවුනට පරීක්ෂණයක් ලෙසින් එවන්නෝ වූයෙමු. එහෙයින් (සාලිහ්!) නුඹ ඔවුන් ගැන විමසිල්ලෙන් සිටිනු. තවද ඉවසීමෙන් සිටිනු.

وَنَبِّئْهُمْ أَنَّ الْمَاءَ قِسْمَةٌ بَيْنَهُمْ ۖ كُلُّ شِرْبٍ مُحْتَضَرٌ {28}

නියත වශයෙන්ම ඔවුන් අතර (හා ඔටු දෙන අතර) ජලයට කොටසක් ඇත. සෑම පාන වාරයක්ම ඉදිරිපත් කරනු ලබන්නකි.

فَنَادَوْا صَاحِبَهُمْ فَتَعَاطَىٰ فَعَقَرَ {29}

එවිට ඔවුහු ඔවුන්ගෙන් වූ සගයකු කැඳවූහ. එවිට ඔහු (කඩුව) අමෝරා ගෙන (උගේ) ගෙල නහර කපා හැරියේය.

فَكَيْفَ كَانَ عَذَابِي وَنُذُرِ {30}

එවිට මාගේ දඬුවම හා මාගේ අවවාදය කෙසේ වී ද?

إِنَّا أَرْسَلْنَا عَلَيْهِمْ صَيْحَةً وَاحِدَةً فَكَانُوا كَهَشِيمِ الْمُحْتَظِرِ {31}

නියත වශයෙන්ම අපි ඔවුන් වෙත එක් ගිගුරුම් හඬක් එව්වෙමු. එවිට ඔවුහු සත්ව ගාලක පෑගුණු පිදුරු මෙන් වූහ.

وَلَقَدْ يَسَّرْنَا الْقُرْآنَ لِلذِّكْرِ فَهَلْ مِنْ مُدَّكِرٍ {32}

තවද අල් කුර්ආනය මෙනෙහි කිරීම සඳහා සැබැවින්ම අපි පහසු කළෙමු. එහෙයින් මෙනෙහි කරන කිසිවකු හෝ වෙත් ද?

33-40 ලූත් අලෙයිහිස් සලාම් තුමා තම සමූහයා සමග.

كَذَّبَتْ قَوْمُ لُوطٍ بِالنُّذُرِ {33}

ලූත්ගේ ජනයා ද එම අවවාදය බොරු කළෝය.

إِنَّا أَرْسَلْنَا عَلَيْهِمْ حَاصِبًا إِلَّا آلَ لُوطٍ ۖ نَجَّيْنَاهُمْ بِسَحَرٍ {34}

නියත වශයෙන්ම අපි ඔවුන් වෙත ගල් කුණාටුවක් එව්වෙමු. (එය ඔවුන් විනාශ කළේය.) නමුත් ලූත්ගේ ජනයා වෙත හැර. අපි ඔවුන් අලුයම් කාලයේ මුදවා ගත්තෙමු.

نِعْمَةً مِنْ عِنْدِنَا ۚ كَذَٰلِكَ نَجْزِي مَنْ شَكَرَ {35}

(මෙය) අප වෙතින් වූ ආශිර්වාදයක් වශයෙනි. අපි ගුණගරුක වූවනට ප්‍රතිඵල පිරිනමනුයේ එලෙසය.

وَلَقَدْ أَنْذَرَهُمْ بَطْشَتَنَا فَتَمَارَوْا بِالنُّذُرِ {36}

තවද අපගේ ග්‍රහණය පිළිබඳ සැබැවින්ම ඔහු(ලූත්) ඔවුනට අවවාද කළේය. නමුත් එම අවවාදය

පිළිබඳ ඔවුහු සැක (කොට තර්ක) කළෝය.

وَلَقَدْ رَاوَدُوهُ عَنْ ضَيْفِهِ فَطَمَسْنَا أَعْيُنَهُمْ فَذُوقُوا عَذَابِي وَنُذُرِ {37}

ඔහුගේ ආගන්තුකයින් පිළිබඳ අශීලාචාර ලෙස හැසිරීමට ඔවුහු ඔහුට සැල කළෝය. එවිට අපි ඔවුන්ගේ ඇස් අන්ධ කළෙමු. එහෙයින් "මාගේ දඬුවම හා මාගේ අවවාදය නුඹලා භුක්ති විඳිනු" (යැයි පැවසුවෙමු.)

وَلَقَدْ صَبَّحَهُمْ بُكْرَةً عَذَابٌ مُسْتَقِرٌّ {38}

තවද ස්ථිර දඬුවමක් උදෑසන සැබැවින්ම ඔවුනට උදා විය.

فَذُوقُوا عَذَابِي وَنُذُرِ {39}

එහෙයින් මාගේ දඬුවම හා මාගේ අවවාදය නුඹලා භුක්ති විඳිනු.

وَلَقَدْ يَسَّرْنَا الْقُرْآنَ لِلذِّكْرِ فَهَلْ مِنْ مُدَّكِرٍ {40}

තවද අල් කුර්ආනය මෙනෙහි කිරීම සඳහා සැබැවින්ම අපි පහසු කළෙමු. එහෙයින් මෙනෙහි කරන කිසිවකු හෝ වෙත් ද?

41,42 ෆිර්අවුන්ගේ සේනාව.

وَلَقَدْ جَاءَ آلَ فِرْعَوْنَ النُّذُرُ {41}

තවද ෆිර්අවුන්ගේ ජනයා වෙත ද අවවාදය සැබැවින්ම පැමිණියේය.

كَذَّبُوا بِآيَاتِنَا كُلِّهَا فَأَخَذْنَاهُمْ أَخْذَ عَزِيزٍ مُقْتَدِرٍ {42}

ඔවුහු අපගේ වදන් සියල්ල බොරු කළෝය. එවිට අපි බලවත් බලධාරියාගේ ග්‍රහණයෙන් අපි ඔවුන් ග්‍රහණය කළෙමු.

43-53 කුරෙය්ෂ් ගෝත්‍රික දේව ප්‍රතික්ෂේපකයින් හෙළා දැකීම.

أَكُفَّارُكُمْ خَيْرٌ مِنْ أُولَٰئِكُمْ أَمْ لَكُمْ بَرَاءَةٌ فِي الزُّبُرِ {43}

මොවුනට වඩා නුඹලාගේ දේව ප්‍රතික්ෂේපකයින් ශ්‍රේෂ්ඨ ද? එසේ

නැතහොත් ග්‍රන්ථයන් හි නුඹලාට එවැනි නිදහසක් ලබා දී තිබේද?

أَمْ يَقُولُونَ نَحْنُ جَمِيعٌ مُنْتَصِرٌ {44}

එසේ නැතහොත් "අපි සියල්ලෝම එකිනෙකාට උදව් කරන සමූහයකි" (එයින් ජය ලබන්නෝ වෙමු) යැයි ඔවුහු පවසන්නෝ ද?

سَيُهْزَمُ الْجَمْعُ وَيُوَلُّونَ الدُّبُرَ {45}

මෙම පිරිස පරාජයට පත් කරනු ලබනු ඇත. තවද ඔවුහු පසුපස හැරී යනු ඇත.

بَلِ السَّاعَةُ مَوْعِدُهُمْ وَالسَّاعَةُ أَدْهَىٰ وَأَمَرُّ {46}

නමුත් අවසන් හෝරාව ඔවුනට ප්‍රතිඥා දෙනු ලැබූවකි. තවද අවසන් හෝරාව වඩාත් බිහිසුණුය. තවද වඩාත් අමිහිරිය.

إِنَّ الْمُجْرِمِينَ فِي ضَلَالٍ وَسُعُرٍ {47}

නියත වශයෙන්ම වැරදි කරුවෝ නොමගෙහිය. තවද (නිරා ගින්නේ) දුෂ්කරත්වය තුළය.

يَوْمَ يُسْحَبُونَ فِي النَّارِ عَلَىٰ وُجُوهِهِمْ ذُوقُوا مَسَّ سَقَرَ {48}

ඔවුන්ගේ මුහුණු මතින් නිරයේ ගින්නට ඇදගෙන යනු ලබන දිනයේ සකර් (නම් නිරා ගින්නේ) ස්පර්ශය නුඹලා භුක්ති විඳිනු (යැයි පවසනු ලැබේ.)

إِنَّا كُلَّ شَيْءٍ خَلَقْنَاهُ بِقَدَرٍ {49}

නියත වශයෙන්ම අපි සෑම දෙයක්ම එය ප්‍රමාණයකින් යුතු ව මැව්වෙමු.

وَمَا أَمْرُنَا إِلَّا وَاحِدَةٌ كَلَمْحٍ بِالْبَصَرِ {50}

තවද අපගේ නියෝගය එක් වරක් පමණි. (එය) ඇසි පිය ගසන්නාක් මෙනි.

وَلَقَدْ أَهْلَكْنَا أَشْيَاعَكُمْ فَهَلْ مِنْ مُدَّكِرٍ {51}

තවද සැබැවින්ම අපි නුඹලා මෙන් වූවන් විනාශ කළෙමු. එහෙයින් මෙනෙහි කරන කිසිවෙකු හෝ වෙත් ද?

وَكُلُّ شَيْءٍ فَعَلُوهُ فِي الزُّبُرِ {52}

තවද ඔවුන් සිදු කළ සියලු දෑ ලේඛන වල (ලියවී) ඇත.

وَكُلُّ صَغِيرٍ وَكَبِيرٍ مُسْتَطَرٌ {53}

තවද කුඩා හා විශාල සියලු දෑ ලියා තබනු ලැබීය

54,55 දේව බිය හැඟීමෙන් යුතු ව කටයුතු කරන්නන් හට හිමි ප්‍රතිඵල.

إِنَّ الْمُتَّقِينَ فِي جَنَّاتٍ وَنَهَرٍ {54}

නියත වශයෙන්ම බිය බැතිමතුන් උයන් හා ගඟ අතරය.

فِي مَقْعَدِ صِدْقٍ عِنْدَ مَلِيكٍ مُقْتَدِرٍ {55}

සර්ව බලාධිකාරී රජු අබියස සත්‍යය ස්ථානයෙහිය.